# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 22 දරන ගුවන් ගමනාගමන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 20 යි　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1981 අංක 22 දරන ගුවන් ගමනාගමන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 23 වන දින]

එල්. ඩී.—ඕ. 90/80.

**ගුවන් ගමනාගමන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඩු නාමය.

**1.** මේ පනත 1981 අංක 22 දරන ගුවන් ගමනාගමන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

365 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** ගුවන් ගමනාගමන පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ජ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

> " (ජජ) ශ්‍රී ලංකාවේ යම් ආණ්ඩුවේ අධිකාරියක් විසින් හෝ ගුවන් තොටුපළක් විසින් හෝ සපයනු ලබන ගුවන් ගමනාගමන සේවා හෝ පහසුකම් ප්‍රයෝජනයට ගනු ලැබීම සම්බන්ධයෙන්, ගුවන් තොටුපළකට අවතීර්ණ නොවී ගමන් කරන ගුවන් යානාවලින් අය කරනු ලැබිය හැකි ගාස්තු විධිමත් කිරීම ; ".